රජයේ නිවේදන

සුරාබදු ආඥාපනත

අංක 01/2022 දරන සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 32 වන වගන්තිය සමඟ කියවිය යුතු 25 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, බැසිල් රාජපක්ෂ වන මා විසින් මෙම නිවේදනය මගින්, 2015 දෙසැම්බර් මස 31 වන දින අංක 1947/42 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 986 දරන සුරාබදු නිවේදනයේ II වැනි කොටසෙහි සඳහන් (i) තරු 3 හා තරු 4 හෝටල් සහ (ii) තරු 5 හා ඊට ඉහළ ගණයේ හෝටල්/ බුටික් හෝටල්/ බුටික් විලා/ පෞරාණික වැදගත්කමක් ඇති හෝටල් සඳහා මද්‍යසාර භාවිතයට අයකරනු ලබන ගාස්තු ගෙවීම 2022 වර්ෂයේ මාර්තු 31 දින දක්වා පමණක් නිදහස් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

**බැසිල් රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2022 ජනවාරි මස 01 වන දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.